**අකුරැස්ස ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 09 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ප්‍රධාන ලේකම්ගේ 2017 අප්‍රේල් 30 දිනැති අංක CSS/9/6/6 දරන ලිපිය අනුව රු.249,440 ක් වූ මුද්දර ගාස්තු මගින් සේවක ණය ශේෂ හිලව් කර තිබුණද එය ගිණුමට ගලපා නිරවුල් කර නොතිබුණි.

(ආ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලට සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ රු.363,538 ක මුදල වෙනුවෙන් නැවත ණයහිමි ප්‍රතිපාදන ඇතිකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විවිධ වියදම් රු.411,185 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ඉටු නොකල වැඩයෝජනා 02 ක් වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවට ආපසු ගෙවිය යුතු රු.340,000 ක මුදල වර්ෂයේ ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.7,700,795 ක්වූ කර්මාන්ත 14 ක් වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදන හා ණයහිමි ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.5,142,576 ක දායක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(උ) ඉකුත් වර්ෂයට අදාල කර්මාන්ත 02 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.148,460 ක්වූ රැඳවුම් මුදල් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඍ) ඉකුත් වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ වැඩයෝජනා ඉටුනොකිරීම හේතුවෙන් ආපසු ගෙවිය යුතුවූ රු.899,200 ක ඉතිරි මුදල් වෙනුවෙන් නැවත ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා උපකරණ වියදම රු.2,389,067 ක් අඩුවෙන් දැක්වුණි

(ඒ) ඉකුත් වර්ෂවල සිට ඉදිරියට එමින් පැවති රු.61,881 ක්වූ මුදල් පොතේ හර ශේෂය නිවැරදිව හදුනා ගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට ලියාහැර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.274,746 ක පුස්තකාල පොත් වටිනාකම ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමට බැර කිරීම වෙනුවට සැපයුම් හා උපකරණ වියදම් ගිණුමට බැර කර තිබුණි.

(ඕ) ඉකුත් වර්ෂයේ ඉටුකර තිබූ කර්මාන්ත සඳහා සභාව සතු බැකෝ රථය කුලියට දීමෙන් ලැබී තිබූ රු.337,400 ක ආදායම ආපසු ගෙවිය යුතු තැන්පතු යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ක) ගිවිසුම් ඇප තැන්පත් ගිණුමෙහි හා උපලේඛන අතර වූ රු.73,800 ක වෙනසට හේතු නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව, සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

(ග) කර්මාන්ත 05 ක් වෙනුවෙන් ගෙවියයුතු රු.133,436 ක්වූ රැඳවුම් මුදල් වෙනුවෙන් දෙවරක් ණයහිමි ප්‍රතිපාදන ඇතිකර තිබුණි.

(ජ) ඉකුත් වර්ෂයේ නිමකළ රු.3,251,166ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබූ කර්මාන්ත වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට නැවත ණයහිමි ප්‍රතිපාදන ඇතිකර වියදම සමුච්චිත අරමුදලට ගැලපීම් කර තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂයේ ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර වියදම රු.118,303 ක් අඩුවෙන් දැක්වුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 15,682,442 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.2,155,037 ක අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.5,474,834 ක් වූ ප්‍රාග්ධන ආධාර ණයගැති ශේෂය තුළ, අවුරුදු 03 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.2,314,236 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.760,510 ක්වූ අතුරලිය ප්‍රාදේශීය සභා ණයගැති ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

**-------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.11,782,587ක් වූ ණයහිමි ශේෂය තුළ අවුරුදු 03 ක කාලයක් ඉක්මවා තිබූ එකතුව රු.9,632,814 ක් වූ ශේෂ ඇතුළත් වී තිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

-------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.248,540,610 ක්වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.2.5 අනුකූල නොවීම්**

**-------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-------------------------------------------------------------------------

නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | |
| (i) 49 හා 52 වගන්ති | යොමුගත වගන්තිය ප්‍රකාරව අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) 150 (4) වගන්තිය | සභාවට අයත් රු.38,743,452 ක ආදායම් අය කිරීම සඳහා සභාවේ ලේකම්ගේ අවධානය යොමු වී නොතිබුණි. |
| (iii) 138 (1) වගන්තිය | 2010 වර්ෂයෙන් පසු වරිපනම් තක්සේරුව සිදු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2014 දෙසැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2014/3(i) චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට අදාළ නොවන අයුරින් ප්‍රජා නිලධාරිනිය සඳහා රු.26,250 ක දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,364,504 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 17,834,074 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

------------------------

### 2.2.1 ඇස්තමේන්තු ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,215,305 | 3,629,596 | 3,501,368 | 1,370,191 | 3,650,000 | 3,873,172 | 4,196,081 | 1,241,963 |
| කුලී | 5,580,550 | 5,237,183 | 4,131,109 | 6,808,482 | 4,675,563 | 5,359,766 | 4,879,765 | 5,702,408 |
| බලපත්‍ර ගාස්තු | 1,317,000 | 1,087,982 | 1,087,982 | -- | 1,192,000 | 994,608 | 994,608 | -- |
| වෙනත් ආදායම් | 29,472,000 | 15,869,914 | 18,711,489 | 28,956,506 | 20,618,500 | 22,621,797 | 13,154,984 | 31,798,081 |
| **එකතුව** | 41,584,855 | 25,824,675 | 27,431,948 | 37,135,179 | 30,136,063 | 32,849,343 | 23,225,438 | 38,742,452 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**-----------------------------------------**

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු.41,584,855 ක් වූ අතර බිල් කළ ආදායම රු.25,824,675 ක් විය. රු.38,742,452 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.64,567,127 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.27,431,948ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.37,135,179 ක් වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

**--------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

**(අ) වරිපනම්**

**----------**

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු රු.1,199,083ක් වූ අතර, රු.2,160,981 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.3,360,064 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.2,027,875 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,332,189 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ii) වර්ෂ 01 කට වැඩි හිඟ ශේෂය වු රු.939,850 තුල රු.4,000 වැඩි වරිපනම් ඒකක සංඛ්‍යාව 47 ක්වූ අතර ඉන් අයවිය යුතු මුදල රු.397,088 ක් විය.

**(ආ) අක්කර බදු**

**------------**

ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.59,016 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.15,295 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.36,309 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.38,002 ක් හිඟව පැවතුණි

**2.2.4 කුලී**

-----

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

**(අ) කඩ කුලී**

----------

ආරම්භක හිඟය රු.5,363,488 ක් වූ අතර, රු.2,796,975 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.8,160,463 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.1,901,900 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.6,258,563 ක හිඟ ශේෂයක් පැවතුණි.

**(ආ) බිම් බදු**

---------

ආරම්භක හිඟය රු.378,309 ක් වූ අතර, රු.307,416 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.685,725 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.135,807 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.549,918 ක් හිඟ ශේෂයක් පැවතුණි.

**2.2.5 වෙනත් ආදායම්**

-----------------

සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජල යෝජනා ක්‍රමයේ ජල පාරිභෝගිකයින් 23 ක් සඳහා වර්ෂයේ බිල්කල ආදායම රු. 120,209 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟය රු. 92,406 ක් විය.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.3,725,145 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.18,538,043 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කාර්ය සාධනය**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

---------------

කසළ බදු අය කිරීම සඳහා 2002 වර්ෂයේ සිට අතුරු ව්‍යවස්ථා පනවාගෙන තිබුණද රෝහල්, කර්මාන්තශාලා, නිවාස සංකීර්ණ හා මාංශ අලෙවිසැල්වලින් කසළ එකතු කිරීම වෙනුවෙන් කිසිඳු බදු මුදලක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් සියල්ලම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) කර්තව්‍යයන් ඉටු නොකිරීම**

-----------------------------------

(i) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාශයේ ප්‍රතිපාදන මත 2016 වර්ෂයේ ව්‍යාපෘති වෙනුවෙන් අනුමත රු.4,500,000 ක මුදලින් ලැබී තිබූ රු.1,000,000ක අත්තිකාරම් මුදලින් රු.450,835ක මුදලක් වැයකර ඉතිරි මුදල අමාත්‍යාංශයට ආපසු යවා තිබුණි. අදාළ ව්‍යාපෘති ඉටු කර වියදම් වාර්තා ඉදිරිපත් කර අනෙක් ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපූර්ණය කරවාගෙන නොතිබීම නිසා ලැබීමට තිබුණු රු.3,500,000 ක මුදලද අහිමි කරගෙන තිබුණි.

(ii) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ සමාලෝචිත වර්ෂයට රු.9,822,180 ක් වූ ව්‍යාපෘති 03 ක් අනුමත කර තිබුණද වර්ෂය තුළ අදාළ ව්‍යාපෘතිය ඉටු නොකිරීම නිසා අනුමත මුදල ලැබී නොතිබුණි.

(ඇ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

සන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් වැටුප් හා දීමනා, ඉන්ධන හා වාහන අළුත්වැඩියා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.4,035,565 ක වියදම් දරා තිබූ නමුත්, සභාව විසින් එකතු කරනු ලබන සියලු කසළ නගර මධ්‍යයේ ඉඩමකට බැහැර කරමින් පැවතුණි. පිළිසරු ව්‍යාපෘතිය යටතේ කාබනික පොහොර මධ්‍යස්ථානයක් ඉදි කිරීමට සැළසුම් කර ඉඩමක් ලබාගෙන තිබුණද , එම ඉඩම කසළ බැහැර කිරීම සඳහා යොදා ගෙන නොතිබූ අතර සභාව විසින් පරිසර බලපත්‍රයද ලබාගෙන නොතිබුණි.

(ඉ) **තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාල මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සංවර්ධන ව්‍යාපෘති 15 ක් සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනවලින් අදාළ කාර්යයන් සඳහා යොදා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රු.940,000 ක මුදලක් රඳවා ගෙන තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක සංඛ්‍යා සැළැස්මේ අනුමත තනතුරුවල පුරප්පාඩු 12 ක් සහ අතිරික්තය 03 ක් විය.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 3/2014 හා 2014 මාර්තු 31 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි සේවකයෙකු බඳවාගෙන 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු. 553,202 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අයවැය ලේඛනය අනුව සුභසාධන සේවා යටතේ රු.1,600,000 ක ඇස්තමේන්තු කර තිබුණද ඊට අදාල කිසිඳු කාර්යයක් ඉටුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ වීථි පහන් නඩත්තුව වෙනුවෙන් රු. 382,300 ක උපකරණ නිකුත් කර තිබුණි. සභාව සතු වීථි පහන් කණු සංඛ්‍යාව අංක කර නොතිබූ අතර අනුමත

වීජී පහන් කණු සංඛ්‍යාව ඉක්මවා වීජී පහන් නඩත්තු කිරිම සඳහා  රු.298,522 ක මුදලක් සභාවට දැරීමට සිදුවී තිබුණි.

**3.5 වත්කම් කළමණාකරණය**

---------------------------

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.80,387,915 ක්වූ ස්ථාවර වත්කම් ලේඛනගත කර නොතිබුණි.

**3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

-------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ඉඩම් කැබලි 28 ක් ආරක්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි.

(ආ) සභාව සතු ඉඩම් 02 ක අනවසරයෙන් ව්‍යාපාරික කටයුත්තක් වෙනුවෙන් ගොඩනැගිලි ඉදිකර දේපල භුක්ති විඳිමින් පැවතුණ නමුත් වත්කම් අවභාවිතාවීම හෝ අනවසර ඉදිකිරීම් පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.5.3 පවරා නොගත් වත්කම්**

-------------------------

2017 දෙසැම්බර් 31 වන විටත් සභාව විසින් රාජ්‍ය ආයතන සතු  වාහන 03 ක් පරිහරණය කරමින් තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරන ලද වියදම රු.1,008,675 ක් විය.

**3.5.4 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්**

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ඉඩම් 16 ක් කිසිදු ප්‍රයෝජනවත් කටයුත්තකට යොදවා ගෙන  නොතිබුණි.

(ආ) සභාව සතු රු.645,000 ක් වටිනා ට්‍රැක්ටරය සහ රු.1,310,000 ක් වටිනා ඩබල් කැබ් රථය වර්ෂ 02 කට වැඩි කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

**3.6 හඳුනාගත් අලාභ**

-------------------

සභා කාර්යාලය පවත්වාගෙන යාමට 2015 ඔක්තෝබර් මාසයේදී කුලියට ගෙන තිබූ ගොඩනැගිල්ලේ අංශ වෙන් කිරීම සඳහා රු.123,613 ක ද්‍රව්‍ය  මිලදී ගෙන නිකුත් කර තිබුණද ගොඩනැගිල්ල ආපසු  භාර දීමේදී මෙම වෙන් කිරීම් ගලවා ඉවත් කර  සභාවට ගෙනවිත් නොතිබුණි.

**3.7 ප්‍රසම්පාදනය**

-------------

**3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර වර්ෂය තුළ මිලදී ගැනීම් වෙනුවෙන් රු. 5,774,060 ක් වියදම් දරා තිබුණි.

**3.7.2 කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සහා අරමුදල් හා විවිධ ප්‍රතිපාදන යටතේ රු.68,700,000 ක් වූ වැඩ යෝජනා 128 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුනේ රු.1,000,000 ක් වූ එක් වැඩ යෝජනාවක් පමණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 08 ක එකතුව රු.34,077,176 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම් සියයට 01 සිට 97 දක්වා පරාසයක පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් 08 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.27,650,221 ක් වූ අතර, එම වටිනාකම් සියයට 06 ත් සියයට 81 ත් අතර පරාසයක පැවතුණි.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

------------------------------------

2009 ජූනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවත්වා තිබුණේ රැස්වීම් 01 ක් පමණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

-----------------------

අභ්‍යන්තර විගණනය පිළිබඳව ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපති සමඟ සාකච්ඡා කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණයවූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ගිණුම්කරණය